# ප්‍රශංසා එකතු සුපුවත
## 2017 සැප්තැම්බර් මස 4 වෙනි දින සිට සැප්තැම්බර් 10 දින දක්වා
## දයාවන්තයෝ භාග්‍යවන්තයෝය.ඔව්හු දයාව ලබන්නේය.

(ශු.මතෙව් 5:7)

01. ප්‍රශංසාවට යොමුව

* දෙවි මහෝත්තමයාණන් වහන්සේ ඉතා දයාන්විතය. **" කෙලෙහි ගුණ නොදත් අයටද දුෂ්ඨයන්ටද ඔවුන් වහන්සේ කාරුණිකය."** ඔවුන් වහන්සේ දුදනන් හට හා සුදනන් හට තම හිරු එළිය උදා කරවන සේක. දමිටුන් හට හා අදිමිටුන් හට වැසි වස්වන සේක. මේ මහා දයාවන්ත, කාරුණාවන්ත අබ්බා තාත්තාට අපි හදවතින්ම ස්තුති ප්‍රශංසා කරමු. පුබුදු ගී අංක 217 "සමිඳාණෝ වෙනි ම එඩේරාණෝ......."

02. පසුගිය සතිය තුළ ඔබ අත්දුටු අත්දැකීම් කුඩා කාණ්ඩායම් තුළ බෙදා ගන්න.

03. සතියේ සුපුවත

ශු.ලූක් 6:32-36 දක්වා කියවන්න

i. දයාවන්ත කමේ පරම ආදර්ශය හැටියට ක්‍රිස්තුස් වහන්සේ අපට පෙන්වන්නේ පියාණන් වහන්සේවයි.
**"ඔබේ පියාණන් වහන්සේ දයානුකම්පා ඇතිව සිටින්නාක් මෙන්ම ඔබ ද දයා අනුකම්පා ඇතිව සිටින්න"** යැයි සමිඳාණෝ පවසන සේක.

ii. පියාණන් වහන්සේ සුවිශුද්ධය. එම නිසා එතුමාණන්ගේ දයානුකම්පාව වෙනස්ය. මනුෂ්‍ය දයාවට වඩා වෙනස්ය. එය අසීමිතය, විශ්වයියය, ඔවුන් වහන්සේ සැමට එක ලෙස සලකන සේක; දයා කරුණාව පෙන්වන සේක.

* පියාණන් වහන්සේගේ දයා කරුණාව ගැන ඔබ දන්නා දේත්, ඔබ අත් දැක ඇති දේත් ලඟ ඉන්න කීප දෙනෙක් සමඟ බෙදා ගන්න.

iii. සාමාන්‍ය ජනතාව තමාට ප්‍රේම කරන අයට ප්‍රේම කරති; තමන්ට යහපත කරන්නන්ට යහපත කරති. "පව්කාරයෝ පවා එසේ කරති"යි. සමිඳාණෝ පවසති.

iv. ක්‍රිස්තියානි දයාවන්ත වීම ඉන් එහා ගිය එකක් විය යුතු බව සමිඳාණෝ පවසන සේක.
**"එහෙත් ඔබේ සතුරන්ට ප්‍රේම කරන්න; යහපත කරන්න, ආපසු ලබන බලාපොරොත්තුවක් නැතිවම ණයට දෙන්න"** (ශු.ලූක් 6:35)

v. සමිඳාණන් වහන්සේ පවසන ආකාරයට දයාවන්ත වන අයට ලැබෙන පල විපාක ඉමහත්ය. **" ඔබ පරමෝතතමයාණන්ගේපුත්‍රයෝ වන්නහුය."** (ශු.ලූක් 6:35)
අප දේව පුත්‍රභාවයට ඔසවනු ලැබීම අපට ලැබිය හැකි උතුම්ම ත්‍යාගයකි; දේව දයාවේ උතුම්ම අත්දැකීමකි.

vi. මෙලෙස බලන විට **" දයාවන්තයෝ භාග්‍යවන්තයෝය. ඔව්හු දයාව ලබන්නෝය."** යන්න ක්‍රිස්තු ශ්‍රාවකයා මෙලොවදීම ලබන අත්දැකීමකි.

04. අප දෙසට

* ඔබ ක්‍රිස්තු දැක්මට අනුව දයාව දක්වන කෙනෙක්දැයි සිතා බලන්න. ඔබ දයාව දක්වන්නේ ඔබට දයාව දක්වන, අයට පමණද? ඔබට සතුරුකම් කරන අයට, ඔබට දයාව නොදක්වන අයට, ඊර්ෂ්‍යයා කරන අයට, ඔබව කොන් කරන අයට ඔබ දයාව දක්වනවාද?

05. මේ සතිය පුරා, මුල් පියවරක් හැටියට අපට සතුරුකම් කරන අය වෙනුවෙන් යාච්ඤා කරමු.

* දයාව ලැබිය යුතු අය කවුරුන් වුනත් ඒ අයට දයාවන්ත වීමට පියවර ගනීමු. උදව් උපකාර ලැබිය යුතු කෙනා කවුරුන් වුනත් උදව් උපකාර ඔවුනට කරන්නට පියවර ගනිමු.

පුබුදු ගී අංක 150 "ඔබෙන් තොරවූ... "ගයමින් අවසාන ප්‍රශංසාවට යොමු වෙමු.

====================

## ප්‍රශංසා එකතු සුපුවත

### 2017 සැප්තැම්බර් මස 11 වෙනි දින සිට සැප්තැම්බර් 17 දින දක්වා

### "නිර්මල සිත් ඇත්තෝ භාග්‍යවන්තයෝය; ඔවුහු දෙවියන් වහන්සේ දකින්නෝය"

(ශු.මතෙව් 5:8)

01. ආරම්භක ප්‍රශංසාව

පුබුදු ගී අංක 03 "ආ එනු මැනේ...."

02. ප්‍රශංසාවට හැඳින්වීම :

කිතුනුවන් වූ අපේ ඇදහිල්ල විශ්වාසය අප අදහන තැනැන් වහන්සේ මළවුන්ගෙන් උත්ථාන වී අප අතර ජීවමානව වැඩ වසන බවයි. උත්ථානයේ බලය අත්දකින්නන් ලෙස දෙවියන් වහන්සේට ස්තුති ප්‍රශංසා කරන්නට අප ලබා ඇති වරප්‍රසාදය ගැන අපි තුති පුදමු. උත්ථාන වූ සමිඳාණන් වහන්සේව අප මධ්‍යයට කැඳවන්නට අපි එක්සිත් වෙමු. එකමුතු වෙමු. සමිඳාණන් වහන්සේ අපට දී ඇති බලගතු පොරොන්දුව අයිති කරගෙන ප්‍රශංසාවට ඇතුළු වෙමු. "මන්ද යම් තැනක දෙදෙනෙක් හෝ තුන්දෙනෙක් මාගේ නාමයෙන් රැස්ව සිටිත්ද එතැන ඔවුන් මැද මමත් වැඩ සිටිමි." (ශු.මතෙව් 18:20)

පුබුදු ගී අංක 19 "අප ජීවයනයද ඔබ වේ...."

03. දවසේ සුපුවත :

**"නිර්මල සිත් ඇත්තෝ භාග්‍යවන්තයෝය; ඔවුහු දෙවියන් වහන්සේ දකින්නෝය"**

(ශු.මතෙව් 5:8)

* නිර්මලභාවයෙන් අදහස් කරනුයේ දෙවියන් වහන්සේ කෙරෙහි එක්සිත් ඇතිව, අචල භක්තියකින් යුතුව පැවතීමයි. පුරාණ ගිවිසුම තුළ දේව මාලිගාවේදී දෙවියන් වහන්සේ අභිමුවට පැමිණෙන විට පවිත්‍ර හදවතකින් හා පිරිසිදු අත් ඇතිව සිටිය යුතු බව ගීතාවලියේ කතුවරයා සඳහන් කරයි. (ගීතාවලිය 24:3-4)

* නිරන්තරයෙන්ම පියාණන් වහන්සේව දුටු ජේසු සමිඳාණන්ගේ දෙනෙත, හදවත මොනතරම් පිරිසිදුද? නොකැළැල්ද? නිර්මලද?

* **"ඔවුහු දෙවියන් වහන්සේව දකින්නෝය"**
සුන්දරත්වය ඇත්තේ දකින්නාගේ දෙනෙතෙහිය. පියාණන් වහන්සේ මවන ලද සියල්ල සුන්දරත්වයෙන් පිරී ඇති බව දකිමින් පියාණන් වහන්සේව මහිමයට පත් කරන්නට ඔවුන් වහන්සේ ක්‍රියා කලේ නිර්මල, පිරිසිදු දෙනෙතකින් සියල්ල දකිමිනි.

ළඟ සිටින කෙනෙකු සමඟ බෙදා ගන්න.

04. ප්‍රායෝගිකව :

* ජේසු සමිඳාණන් වහන්සේගේ නිර්මල නොකිළිටිවූ නෙත සිත හදවත අපට මොනතරම් අභියෝගයක්ද?

* අපේ ජීවිතවල සමිඳාණන් මෙන් පියාණන් වහන්සේ දෙස බලන්නට ඇති අවදිවීම හා පිපාසය

කොතෙක්ද?

* නිර්මල සිතක් අප තුළ ඇති කර ගන්නට අප කළයුත්තේ කුමක්ද?

05. සතිය පුරා:
ශුද්ධාත්ම ගින්නෙන් පවිත්‍ර වීම, ශුද්ධාත්ම එළියෙන් ආලෝකමත් වීම, ශුද්ධාත්ම ජලයෙන් පවිත්‍රවීම නිර්මල සිතකට මාවතය. අපි වැඩි වැඩියෙන් ශුද්ධාත්මයාණන් වහන්සේට ඉඩ දෙමු.

06. අවසාන ප්‍රශංසාව :
පුබුදු ගී අංක 100 "නිමල මරිය කුමරි වගේ....."

==============================

## ප්‍රශංසා එකතු සුපුවත
**2017 සැප්තැම්බර් මස 18 වෙනි දින සිට සැප්තැම්බර් 24 දින දක්වා**
**" සාමය ඇති කරන්නෝ භාග්‍යවන්තයෝය. ඔව්හු දෙවියන් වහන්සේගේ පුත්‍රයෝ යයි කියනු ලබන්නෝය."** (ශු.මතෙව් 5:9)

01.ප්‍රශංසාව සඳහා යොමුව

* මංගල වාක්‍ය වනාහි ක්‍රිස්තුන් වහන්සේගේ ධර්මදේශන වල හරයයි. කන්ද උඩ දේශනය මඟින් ඔවුන් වහන්සේ දේව රාජ්‍යයේ ප්‍රඥාප්තිය ප්‍රකාශයට පත්කල සේක. භාග්‍යයන් ක්‍රිස්තුන් වහන්සේගේ ජීවිත අත්දැකීමයි.
* ක්‍රිස්තුන් වහන්සේ මෙසේ ඔවුන් වහන්සේගේ ජීවිත දැක්ම, ක්‍රිස්තු ශ්‍රාවක අපට තෑගි කර දෙමින්ද, ආබ්‍රහම් තුමාගේ පටන් තෝරාගත් ජනතාවට දුන් ස්වර්ගීය පොරොන්දුව මුල් කරගෙන සමිඳාණන් වහන්සේට අපගේ නමස්කාරය හා ප්‍රශංසාව පුද කරමු.

02. පසුගිය සතියේ ප්‍රශංසා එකතු සුපුවත මුල් කරගෙන අත්දැකීම් බෙදා ගන්න

* පසුගිය සතියේ අපගේ තේමාව - **" නිර්මල සිත් ඇත්තෝ භාග්‍යවන්තයෝය. ඔව්හු දෙවියන්වහන්සේ දකින්නෝය."**
* පොදුවේ බෙදා ගනිමින් කෙටි ප්‍රශංසාවකට යොමු වෙමු.

03. සතියේ සුපුවත
* ශු.මතෙව් 5:9 - වගන්තිය පොදුවේ කියවා, කුඩා කණ්ඩායම් තුළ සකච්ඡා කරමින් ලැබෙන ආලෝකයන් බෙදා ගන්න.

04. සුපුවත ගොඩ නැගීම සඳහා
* ජේසුස් ක්‍රිස්තුන් වහන්සේගේ සෑම වදනක්ම, සෑම ක්‍රියාවක්ම ඔවුන් වහන්සේගේ ශුද්ධවූ ප්‍රේමය අත්විදීම සඳහා කැඳවනු ලැබීමකි. එසේම ඉහත සඳහන් සුවිශේෂ වාක්‍ය මඟින් ඔවුන් වහන්සේගේ ශුද්ධවූ කැමැත්ත අපට හෙළිදරව් කර ඇත.
* මේ ලෝකය තුළ දාසකමේ වියගහයට යටවී සිටින මිනිසා සොයන සැබෑ ඇතුලාන්ත සාමය ඇත්තේ ක්‍රිස්තුන් වහන්සේ තුළ පමණකි. ඔවුන් වහන්සේගේ ශුද්ධවූ කැමැත්තට පිපාසය තිබෙන, ඊට ප්‍රේම කරන මිනිසා සැබෑ සාමය අත්පත් කරගනි. පුද්ගලයෙකුට, පවුලකට, සාමජයට, මුළු ලෝකයටම සාමය භුක්ති විදීමට සා පිපාසාවක් ඇත. පිළිතුර සමිඳාණන් වහන්සේයි.
* මහ සිකුරාදාට පෙර දින ඔවුන් වහන්සේ තම ශ්‍රාවකයන්ට සාමය දෙන්නට පොරොන්දුවූ සේක.
* ශු.ජොහාන් 14:27 "සාමය ඔබ වෙත ප්‍රදානය කරමි. මාගේ සාමය ඔබට දෙමි. මා එය

ඔබට දෙන්නේ ලෝකයා දෙන්නාක් මෙන් නොවේ. ඔබේ සිත් කැළඹෙන්නටවත්, බිය වන්නටවත් ඉඩ නොදෙන්න.

05. අප දෙස
* 'සාමය' යනු පැතුමක් නොවේ - ශුද්ධාත්මයාණන් වහන්සේට නතුවීමෙන් අපට ලැබෙන ත්‍යාගයකි. විවිධාකාර ප්‍රශ්න, අභියෝග මධ්‍යයේ නොකැලඹී සිටින්නට ලැබෙන අමුතු බලයකි.
* දේව ආදරයේ තිළිණයකි. එදිනෙදා ජීවිත සිද්ධීන් තුළ, සමිඳාණන් වහන්සේ කෙරෙහි විශ්වාසයෙන් හා බලාපොරොත්තුවෙන් සිට, ප්‍රේමය භුක්ති විඳීමකි.

06. සතිය පුරා ප්‍රයෝගීත වීමට
* අපගේ සිත් කලඹන, සිද්ධීන් හා අනපේක්ෂිත තත්ත්වයන් තුළ ක්‍රිස්තුන් වහන්සේගේ වැඩ සිටීමට අවදිවෙමු. දේව කැමැත්ත,දේව සිත සොයමු.
* දිළිඳු ගව මඩුවක උපත ලැබූ ධර්මයාණන් ලොවට සාමය උදා කළ බැවින් දිළිඳු ගව මඩුවට ඇතුළු වී සමිඳාණන්ගේ ශුද්ධවූ සැලැස්ම කැමැත්ත කුමක්ද කියා මෙනෙහි කරමු.
* සාමය අත්විඳිමින්, ඊට සාක්ෂි දරමු.

07. අවසාන යෙදුම
* පුබුදු ගී අංක 124 "සාමයේ ප්‍රීතියේ සමිඳුනි........."

========================

**ප්‍රශංසා එකතු සුපවත**
**2017 සැප්තැම්බර් මස 25 වෙනි දින සිට සැප්තැම්බර් 30 වෙනි දින දක්වා**
**" මිනිසුන් මා නිසා ඔබට නින්දා පීඩා කොට**
**නානාවිධ අයුතු චෝදනා නඟන කල ඔබ භාග්‍යවන්තයෝය....."**

(ශු.මතෙව් 5:11)

01. ප්‍රශංසාව සඳහා යොමුව

* දේව රාජ්‍ය අප කෙරෙහි උදා වන්නේ, අපි මනුෂ්‍ය ආකාරයෙන් සිතන පතන අන්දමින් නොවේ. දෙවියන් වහන්සේ සුවිශුද්ධය. ඔවුන් වහන්සේගේ සැලසුම් සුවිශුද්ධය. එසේම කැමැත්ත අභිප්‍රාය සුවිශුද්ධය.
* ඔවුන් වහන්සේගේ ශුද්ධවූ කැමැත්ත අපගේ මිනිස් අවබෝධය අභිබවා යන්නකි. එය අපට මිනිස් බුද්ධියෙන් තේරුම් ගැනීමට නොහැකි වුවද, ඔවුන් වහන්සේ අපට හෙළිදරව් කරන සේක.

* පුබුදු ගී අංක 5 "ඥාන වීර්ය ශක්ති දැනුම - වගුරුවමින් වඩිනු මැනවි...."

02. පසුගිය සතියේ ප්‍රශංසා එකතු සුපුවත මුල් කරගෙන අත්දැකීම් බෙදා ගන්න
* පොදුවේ බෙදා ගනිමින් කෙටි ප්‍රශංසාවට ඇතුළු වෙමු.

03. සතියේ සුපුවත
* ශු.මතෙව් 5:11 - වගන්තිය කියවා, කුඩා කණ්ඩායම් තුළ සාකච්ඡා කොට ලැබෙන ආලෝකයන් බෙදා ගන්න.

04. සුපුවත ගොඩ නැඟීම සඳහා
* ක්‍රිස්තුන් වහන්සේ උදෙසා පීඩා විඳින්නටත් තමන් වහන්සේගේ පරමානන්දය කරාද අපව කැඳවන සේක. මංගල වාක්‍ය මඟින් ඔවුන් වහන්සේ අපගේ මිනිස් දිවියේ අරමුණ කුමක්දැයි හෙළිදරව් කරන සේක.
* සුභ අස්න නැමති ජේසුස් ක්‍රිස්තුස් වහන්සේව, ලෝකයට ප්‍රකාශ කිරීම, දේව රාජ්‍යයේ

පුරවැසියන්ද දේව දරුවන්ද වන අපගේ කැඳවීමයි. දේව ස්වභාවයේ හා අනන්ත ජීවිතයේ පංගුකාරයන් කර ගැනීමෙන් දේව ප්‍රීතියට ඇතුළු කර ගැනීම සමිඳාණන් වහන්සේගේ ශුද්ධවූ අරමුණයි.

* රෝම 8:18 - **"මේ ජීවිතයේ දුක් වේදනා අපට මතු එළිදරව් වෙන්නට යන මහිමය සමඟ කිසිසේත් සැසඳිය නොහැකි යයි කල්පනා කරමි."**

* සැබවින්ම, ශු.පාවුළු තුමා මේ මඟින් අපට ප්‍රකාශ කරන්නේ කුමක්ද? දෙවියන් වහන්සේගේ ශු.කැමැත්තට අනුකූලව ජීවත්වීම, ඊට පිළිතුරු දීමේදී විවිධාකාර පීඩා පැමිණීමට ඉඩ ඇති බවයි. මන්ද දේව කැමැත්තට පිපාස වන තැනැත්තා,අන් අයවද දේව කැමැත්ත ඉටු කිරීමට යොමු කරවයි. එවිට නින්දා, පීඩා ලැබීමට සිදුවනු නියතය. එහෙත් ස්ථිරව සිටිමින් දේව රාජ්‍ය සඳහා වැය වෙන, කැපවෙන අයට ඔවුන් වහන්සේගෙන් ලැබෙන ප්‍රසාද දීමනාව ස්වර්ගීය උරුමයයි.

05. අප දෙස

* මෙලොව සැප සම්පත් භුක්ති විදීමේ පිපාසයට වඩා ස්වර්ගීය සැපත කෙරෙහි අපි අධිෂ්ඨාන කර ගනිමු. ඉහත කී පරිදි ක්‍රිස්තුන් වහන්සේ නිසා සමාජයෙන් අපට උරුම වන, එවැනි පීඩාවන්, දුක් වේදනාවන්, පරාජිත, අසරණ තත්ත්වයන් හමුවේ අපගේ හදවත් පවිත්‍ර කර ගනිමු.
* ආදරයේ උල්පත වූ සමිඳාණන් වෙත අප රැගෙන යන යාච්ඤා ජීවිතයකට පිවිසෙමු. ශුද්ධාත්මයාණන් විසින් මඟ පෙන්වනු ලබන අපව මෙහෙයවනු ලබන ජීවිත ගමනකට ඇතුළු වෙමු.
* දුක් පීඩා මැද, අභ්‍යන්තර ප්‍රීතියකින් ජීවත් වීම මඟින් අන් අය වෙත ගොස් සාක්ෂි දරමු.

06. අවසාන යාච්ඤාව

* මනස්ථාපනය වෙමු. මන්ද අනපේක්ෂිත සිද්ධීන් ඉදිරියේ යහපත කිරීමට ගොස් මුහුණ දීමට සිදුවූ තත්ත්වයන් තුළ සුව අනුකම්පාවට යටවී සාක්ෂි දැරීම දුර්වල කරගත් කරගත් අවස්ථාවන් වෙනුවෙන්

පුබුදු ගී අංක 136 "කපල හෙල තෙක් පිරූ කුරුසියේ ...."

*****************